### ප්‍රවෘත්ති නිවේදනය

## ශ්‍රී ලංකාවේ සහ බුරුන්ඩියේ මානව හිමිකම් ක්‍රියාකරුවන් 2007 මාටින් එනල්ස් ත්‍යාගයේ සහ හිමිකරුවෝ වෙති.

**මානව හිමිකම් ආරක්ෂා කරන්නන් සඳහා මාටින් එනල්ස් ත්‍යාගය පිළිබඳ කමිටුවේ එක් සාමාජිකයෙකු වශයෙන් අන්තර් ජාතික ජූරිසභිකයන්ගේ කොමිසම 2007 ත්‍යාග ලාභීන් ලෙස පහත සඳහන් මානව හිමිකම් ක්‍රියාකාරීන් නම් කරයි.**

### රාජන් හූල් සහ කෝපාලසිංහම් ශ්‍රී ධරන්, යන දෙදෙනා

“මානව හිමිකම් සඳහා යාපනය විශ්ව විද්‍යාලීය ආචාර්ය සංගමයේ” සම - නිර්මාතෘවරුන් වන අතර ශ්‍රී ලංකා රජය මෙන්ම දෙමළ කොටි (එල්.ටී.ටී.ඊ) විසින් ද සිදු කළ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව අවධානයෙන් සිට ඒවා නිරන්තරයෙන් වාර්තා කළහ. ඔවුහු තම ජීවිත වලට මහත් තර්ජන එල්ලව පවතිද්දීත් පසුගිය වසර 18 ක් පුරාම, ළමුන්, කාන්තාවන්, සුළුතර පිරිස් සහ අවතැන් වූ පුද්ගලයින්ට සන්නද්ධ ගැටුම් හේතුවෙන් සිදු වූ බලපෑම් පිළිබඳව වාර්තා කළහ. යළිත් සටන් ඇවිලි ගිය අවස්ථාවේ සිට සිදු වූ ත්‍රිකුණාමලයේ ඝාතන 5, තරුණියන් සහ ගැහැණු ළමුන් 51 ක් ඝාතනයට ලක් වූ මුලතිවු බෝම්බ ප්‍රහාරය සහ මානුෂීය ආධාර කණ්ඩායම් සාමාජිකයන් 17 ක් පෙළ ගසා වෙඩි තබා මරා දැමීම ඇතුළු ඉතා බිහිසුණු අපරාධ පිළිබඳව, “මානව හිමිකම් සඳහා යාපනය විශ්ව විද්‍යාලීය ආචාර්ය සංගමය” සත්‍යය හෙළිදරව් කිරීමේ පරීක්ෂණ සිදු කරන ලදී. සියලු පාර්ශව වලින් සිදු කරන උල්ලංඝනය කිරීම නිසාම බොහෝ විට ඔවුන් දෙදෙනාටම එල්.ටී.ටී.ඊ සංවිධානයේ මරණ තර්ජන මැද දිවි ගෙවීමට සිදු වී ඇත. ඔවුන්ගේ සගයෙක් වූ රාජිණී තිරාණගම මරා දැමීමෙන් පසුව, දශකයකට වැඩි කාලයක් පුරා ඔවුන් දෙදෙනාට රහසිගතව කටයුතු කිරීමට සිදු වූ නමුදු, ඔවුන්ගේ වාර්තා ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් බැහැරව හොඳින් ප්‍රසිද්ධියට පත්ව තිබේ.

**පියරේ ක්ලේවර් ම්බොනිම්පා** 1994 දෙසැම්බර් වන තුරු බුරුන්ඩි දේශයේ පො ලිස් නිලධාරියෙකු ලෙස සේවය කළේය. බොරු චෝදනාවකට ලක් වූ ඔහු දෙවසරක් සිරගතව සිටියේය. නිදහස්ව පැමිණි ඔහු, රටේ අධික තදබදයක් සහිත සිර ගෙවල් තුළ නඩු විභාග බලාපොරොත්තුවෙන් අවුරුදු ගණනාවක් පුරා රඳවා සිටින සිරකරුවන් 9000 ක් ඇතුළු, සියළු සිරකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට උදව්දීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන ගොඩනැගීය. වධ බන්ධනවලට එරෙහිව නිර්භීතව ක්‍රියාත්මක වූ ඔහු මානව හිමිකම් ක්‍රියාකාරිකයින් සහ පීඩාවට පත්වූවන් ඉදිරිපත් කරන ප්‍රශ්න වලට පොලිසියේ සහ සන්නද්ධ සේවා නියෝජිතයන්ට ප්‍රසිද්ධියේ පිළිතුරු දීමට සිදුවන වැඩ සටහන් සංවිධානය කළේය. මෑතකදී සිවිල් සමාජයේ සාමාජිකයන් සහ ජන මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගනු ලැබූ විට ඔහු පුද්ගලික අවදානම නොතකා යළිත් කතා කළේය. සිවිල් යුද්ධය විසින් ජීවිත දහස් ගණනක්

බිලිගත් අවදානම් රටක, හුටු, ටුට්සි සහ බට්වා ජනයාගේ අයිතීන් සඳහා නැගී සිටින එකම පුද්ගලයා වශයෙන් ම්බොනිම්පා මහතා බොහෝවිට ප්‍රශංසාවට ලක් වේ.

මාටින් එගල්ස් ත්‍යාගය පිළිබඳ ජූරි සභාවේ සභාපති වන, හැන්ස් තුලන් මෙම සම්මාන ලාභීන් හඳුන්වන්නේ: “මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් නැගී සිටීම බිහිසුණු ක්‍රියාවක් වන ස්වකීය අදාළ දේශයන්හි මානව හිමිකම් ව්‍යාපාරයේ සංකේත” වශයෙන් ගැටුමට සම්බන්ධ පාර්ශව දෙක විසින්ම සිදු කළ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව සාර්ථකව ඉදිරිපත් කිරීම සඳහා සම්මානලාභීන් දැක් වූ ප්‍රතිපත්තිමය ස්ථාවරය ගැන ඔහු අවධානය යොමු කළේය. හිංසාවට ලක්වීමකින් තොරව සම්මානලාභීන්ට සිය කටයුතු කරගෙන යාමට ඉඩකඩ ලබාදෙන ලෙස, මාටින් එනල්ස් ත්‍යාගය සඳහා ජූරියේ සංවිධාන එකොළහක් විසින් ශ්‍රී ලංකා සහ බුරුන්ඩි රජයන්ගෙන් ඉල්ලා සිටියි. මාටින් එනල්ස් ත්‍යාග ප්‍රදානෝත්සවය ඔක්තෝබර් මාසයේදී ජිනීවා නගරයේදී පැවැත්වෙනු ඇත.

මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා මාටින් එනල්ස් ත්‍යාගය :

**මානය හිමිකම් ව්‍යාපාරයේ ප්‍රධාන ත්‍යාගය** ලොව පුරා මානව හිමිකම් සුරක්ෂිත පුද්ගලයන්ට ආරක්ෂාව සැපයීම සඳහා ලෝකයේ මානව හිමිකම් පිළිබඳ ප්‍රධාන සංවිධාන එකොළහක් අතර ඇති වූ විශිෂ්ඨ එකමුතුවක් ලෙස “මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා මාටින් එනල්ස් ත්‍යාගය දැක්විය හැක. ජූරි සභාව පහත සඳහන් රාජ්‍ය නොවන සංවිධාන වලින් සමන්විත වේ. :- ඇම්නස්ටි ඉන්ටර් නැෂනල්, හියුමන් රයිට්ස් වොච්, හියුමන් රයිට්ස් ෆස්ට්, මානව හිමිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මේලනය, වධ හිංසාවලට එරෙහි ජගත් සංවිධානය, මානව හිමික්ම් සඳහා අන්තර් ජාතික සේවාව, ෆ්‍රන්ට් ලයින්, අන්තර් ජාතික ජූරි සභික කොමිසම, ඩයකෝනියා ජර්මනි, ඉන්ටර්නැෂනල් ඇලර්ට්, හරිඩොක්ස්. මෙයට පෙර සම්මාන ලද්දෝ: අක්බාර් ගන්ජි, ඉරානය සහ ආනෝල්ඩ් ට්සුන්ගා, සිම්බාබ්වේ (2006): අක්තම් නේස්, සිරියාව: ලිඩා යුසුසෝවා, රුසියාව: අලිරියෝ උරුබේ මුනෝෂ්, කොලොම්බියාව: ජකොලින් මෝඩියේනා, ඩැඩ්: අන්තර් ජාතික සාම බලකාය: ඉමැකියුලි බිර්හහේකා: කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය: නටාෂා කැන්ඩික්, යුගෝස්ලාවියා: ඉයාඩ් එල් සරාජ්, පලස්තීනය: සැමුවෙල් රුයිස්, මෙක්සිකෝව: ක්ලෙමන්ට් ස්වන්කෝ, නයිජිරියාව, අස්මා ජහන්ගිර්, පකිස්ථානය: හැරි වූ, චීනය.

**මාටින් එනල්ස් ත්‍යාග සඳහා අනුග්‍රාහකයෝ,** අස්මා ජහන්ගිර්, බාර්බරා හෙන්ඩ්ක්ස්, ජෝස් රමෝස් - හෝර්ටා, අඩමා ඩියෙන්ග්, ලෙනාඩෝ ඩෙස්පු, රොබට් ෆුල්හම් සහ කියු වැන් බෝවෙන්

වැඩි විස්තර සඳහා විමසන්න : ලුයිස් බැරෙයර්ස්, සම්බන්ධීකාරක,
+ 41228094925
marreirs@martinennalsaward හෝ www.martinennal&award.org